


# ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන



## ක්‍රියාකාරකම් සම්පාදනය සඳහා

# මාර්ගෝපදේශ සංග්‍රහය





# ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන

## ක්‍රියාකාරකම් සම්පාදනය සඳහා

# මාර්ගෝපදේශ සංග්‍රහය

පිදුම

## විදුහල්පති තුමනි/තුමියනි,

ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන
පාසලේ සියලුම ක්‍රියාකාරකම්
වඩා ඵලදායී ලෙස ක්‍රියාත්මක
කරගැනීමේ මෙවලමක් කරගන්න.

## ගුරු භවතුනි,

ඔබගේ කාර්ය සාධන සඳහා වන
යාන්ත්‍රණයක් කරගන්න.

## සිසු දරු දැරියනි

ඔබගේ නායකත්වය හා පෞරුෂ
සංවර්ධනයටත් ප්‍රජාතන්ත්‍රවාදී
පුරවැසියෙකු ලෙස ජනතා පරමාධිපත්‍ය,
ඡන්දය දීමේ අයිතිය වැනි සංකල්ප
ප්‍රායෝගිකව පීවන කුසලතාවයක් ලෙස
අත්කර ගන්නා ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ
ක්‍රියාධරයෙකු වන්න.

අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය.

# ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන්ගේ පණිවිඩය

# පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය.

රටක අනාගතය රඳා පවතින්නේ අද දවසේ ගනු ලබන තීරණ හා ක්‍රියාකාරකම් මතය. එමෙන්ම අනාගත නායකත්වය වෙනුවෙන් අද දවසේ කරනු ලබන ආයෝජන මත ය. අධ්‍යාපන අමාත්‍යංශයේ උපදෙස් මත පාසල් මට්ටමින් ක්‍රියාත්මක වන ශිෂ්‍ය පාර්ලිමේන්තුව එවැනි අනාගත ආයෝජනයකි. එම අනාගත ආයෝජන ප්‍රතිඵලදායක වනුයේ ශිෂ්‍ය පාර්ලිමේන්තුව හරහා සමාජ වගකීම් හඳුනන, අවංක, අන්‍යමත ගරු කරන, ඉවසිලිවන්ත, සමාජ සාර්ධර්ම, වටිනාකම්, අගයන දේශපාලන හා සිවිල් නායකත්වයන් ගොඩනැගීමට හැකි වුවහොත් පමණි.

එම ගුණාත්මක ක්‍රියාවලිය සඳහා නායකත්වය ගොඩනැගීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යංශයට සහය ලබාදීමට හැකිවීම පිළිබඳ පැෆ්රල් සංවිධානයත්, මාර්තු 12 ව්‍යාපාරයත් නිහතමානීව සතුටු වෙමු.

එමෙන්ම එම කාර්යයේදී අපගේ දායකත්වය ලබාදීමට ඉඩකඩ ලබාදුන් අධ්‍යාපන අමාත්‍යංශ ලේකම් සුනිල් හෙට්ටිආරච්චි මහතාටත්, අතිරේක ලේකම් ..................................., සහ විෂය සමගාමී ............................................ පද්මශාන්ත මහතාටත් මෙම පොත සම්පාදනය කිරීමෙහි ලා නන් අයුරින් සහය වූ සැමටත්, මෙම මගපෙන්වීම භාවිත කරන සැමටත් මාර්තු 12 ව්‍යාපාරයේත්, පැෆ්රල් සංවිධානයේත් කෘතඥතාවය පළකරන අතර “ශිෂ්‍ය පාර්ලිමේන්තු අත්පොත” පරිහරණය කරන විදුහල්පතිවරුන්, ගුරුභවතුන් හා ශිෂ්‍ය පාර්ලිමේන්තු නායකත්වය ගනු ලබන ශිෂ්‍ය නායක නායිකාවන් මෙම පොත සකස් කිරීමේ අරමුණ වන ගුණාත්මක නායකත්වය ගොඩනැගීම සදහා ක්‍රියාකරනු ඇතැයි අප දැඩිසේ විශ්වාස කරමු.

ස්තූතියි.

# පටුන


01 XXXXXXX XXXXXXXX

02 XXXXXXX XXXXXXXX

04 XXXXXXX XXXXXXXX

08 XXXXXXX XXXXXXXX

13 XXXXXXX XXXXXXXX

20 XXXXXXX XXXXXXXX

25 XXXXXXX XXXXXXXX

30 XXXXXXX XXXXXXXX

# හැඳින්වීම

ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය සමගාමී මාර්ගෝපදේශ උපදේශන ශාඛාවේ මූලික මැදිහත් වීම යටතේ පළාත් මට්ටමින්, කලාප හා කොට්ඨාස මට්ටමින් හා පාසල් මට්ටමින් ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පුරවැසියන් වන අප ප්‍රජාතන්ත්‍රවාදි මිනිසුන් ලෙස අර්ථ ගැන්වේ. එනම් පුරවැසියන් වන අපගේ ජීවන ශෛලීයේ පදනම වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී යහපැවත්මයි. එය පුරවැසියකු සතු මූලික සාරධර්මයක් සේම නිපුණතාවයක් ද වේ. එසේනම් පුරවැසියකු සතු නිපුණතා සාක්ෂාත්කර ගනිමින් දරුවා සමාජගත කිරීමේ වගකීම පැවරෙන අධ්‍යාපනය ක්‍රියාවලියේ මූලික පදනම ලෙස ප්‍රජාතන්ත්‍රවාදය සැලකෙන බව අධ්‍යාපන පොදු අරමුණුවලින් පැහැදිලි වේ. නිපුණතාවය සඳහා හුදු දැනුම ආකල්ප, කුසලතාවලින් සීමා නොවී එය ජීවන පුරුද්දක් ලෙස පුරුදු වීමට අවස්ථා සම්පාදනය අධ්‍යාපන ක්‍රියාවලිය තුළ දී අප සැලසුම් සහගතව සිදුකිරීම අවශ්‍ය වේ. මෙය සැබැවින්ම ඉටු නොවන විට එහි ප්‍රතිඵලය ඔවුන් සමාජගත වන විට විද්‍යාමාන වේ. සමාජයක සියලු ආකාර ප්‍රජාතන්ත්‍ර විරෝධි ප්‍රවණතා නිශේධනය කිරීමේ දැවැන්ත විභව ශක්තියක් අධ්‍යාපනය තුළ ඇති බව අප වටහා ගත යුතුවේ. ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදි අනාගත පුරවැසියා බිහි කිරීමේ සාධනාත්මක අධ්‍යාපන ප්‍රවේශයක් ලෙස ශිෂ්‍ය පාර්ලිමේන්තුව සංකල්පය පද්ධතියට යොදා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශය මෙම ක්‍රියාකාරකම් සංග්‍රහයෙන් ඔබ වෙත ලැබෙනු ඇත.

සංකල්පීය වශයෙන් මෙහි අධ්‍යාපනයට ඇති අදාලත්වය සේම පාසලේ එදිනෙදා යෙදෙන සියලු විෂයානුබද්ධ, විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් එක් ඡත්‍රයක් තුළ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවහාරයන් ප්‍රායෝගික කරණයට අවස්ථාව ඒ අනුව ඔබට උදාකර ඇත. මෙය ධනාත්මකව ග්‍රහණය කර ගනිමින් නිර්මාණාත්මකව ක්‍රියාවට නැංවීමට ඔබ සැමට අවස්ථාව ඇති අතර ඒ සඳහා ඇවැසි ශක්තිය ඔබ සතුවන බවට කිසිදු විවාදයක් නැත.

## මෙම ක්‍රියාකාරකම් සංග්‍රහයේ අරමුණු:



01. ශිෂ්‍ය පාර්ලිමේන්තු සංකල්පය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සාධනාත්මක මැදිහත්වීම තුළින් සම්බලනයක් ලබාදීම.

02. මෙම සංකල්පය ප්‍රායෝගිකව පාසල තුළ යථාර්ථයක් කිරීමට අවශ්‍ය මගපෙන්වීම ලබාදීම.

03. ශිෂ්‍ය පාර්ලිමේන්තු සංකල්පය තුළ ඇති කෘත්‍යාත්මක හැකියාව පෙන්වාදෙමින් නිදර්ශන සැපයීම හා ඒ සඳහා අවශ්‍ය ආරම්භක ශක්තිය ලබාදීම.

04. ශිෂ්‍ය පාර්ලිමේන්තු සංකල්පය ප්‍රායෝගික තලයට ගෙන ඒමේදී හඳුනාගත් ගැටළු සඳහා විසඳුම් හා යෝජනා ඉදිරිපත් කිරීම.

05. දැනුම, ආකල්ප, කුසලතා හා පුරුදු තුළින් මෙම සංකල්පය සමස්ත පාසල් සංවර්ධනයට යොදාගැනීම.

06. පාසලේ ඇතිවන නව පිබිදීම තුළින් ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව දක්වා වූ ක්‍රියාවලිය බලගැන්වීම.

07. නිවැරදිව හා සද්භාවයයෙන් පුරවැසියෙකු සතු වගකීම් හා වගවීම් හඳුනාගැනීමට අවස්ථා සම්පාදනය.



## පළමු පරිච්ඡේදය

### පාර්ලිමේන්තු ක්‍රියාකාරී වාර්ෂික සැලැස්ම සම්පාදනය කිරීම.

මහලේකම්ගේ අධීක්ෂණයෙන් ශිෂ්‍ය පාර්ලිමේන්තුවට අදාළ සැලැස්ම සම්පාදනය කිරීමේ වගකීම විධායක කමිටුවට පැවරෙයි. විධායක කමිටුව මහලේකම්, නියෝජ්‍ය මහලේකම් තිදෙනාගෙන් (සංවර්ධන / පාලන / විනය) සමන්විත වේ. එනමුත් වාර්ෂික සැලැස්මට ඇතුළත් විය යුතු දෑ සම්බන්ධයෙන් ශිෂ්‍ය පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට පෙර පාසලේ සිසු දරුවන්ගෙන්, ගුරුවරුන්ගෙන් අදහස් ලබා ගැනීම ප්‍රජාතන්ත්‍රීය ක්‍රමවේදයකි.

මෙවැනි අදහස් ලිඛිතව එකී නියෝජ්‍ය මහලේකම්වරයෙකුට හෝ මහලේකම් විසින් පත් කරන ගුරුවරයෙකුට හෝ ලබා දිය හැකිය. විකල්ප ක්‍රමයක් ලෙසින් 'ශිෂ්‍ය පාර්ලිමේන්තු යෝජනා පෙට්ටිය' ස්ථාපනය කළ හැක.

ලැබුනු යෝජනා හා අදහස් සැලකිල්ලට ගෙන ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ පවතින අමාත්‍යාංශ දහය යටතට ඇතුළත් වන සේ වාර්ෂික සැලැස්ම සැකසීම වැදගත්ය. අවසාන වගකීම විධායක කමිටුව සතුවන අතර මෙයට අදාළ ක්‍රියා පිළිවෙල එක් එක් පාසල් මට්ටමින්, විවිධ පළාත් අනුව කාලෝචිත වෙනස්කම් සිදු කරමින් ඉටුකිරීම ඵලදායක වන්නේය. චක්‍රලේඛයේ සඳහන් පරිදි එක් එක් අමාත්‍යාංශය යටතේ හඳුන්වාදී ඇති ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේදී තනි අමාත්‍යාංශ සේම අමාත්‍යාංශ අතර සහයෝගයෙන්ද සිදු කළ හැකිය.


නිදසුනක් ලෙස, ''සංස්කෘතික, ආගමික කටයුතු හා සාරධර්ම ප්‍රවර්ධන අමාත්‍යාංශය'' මගින් ,පාසල් තුළ ක්‍රියාත්මක කරන සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවය, කලා උළෙල වැනි සංස්කෘතික වැඩසටහන් ද වෙසක්, නත්තල්, හජ්ජි, භක්ති ගීත, කැරොල් වැනි ආගමික වැඩසටහන් ද මාපිය වන්දනාව, ගුරු උපහාර වැනි සාරධර්ම වැඩසටහන් ද සමෝධානය කරමින් මෙම වැඩසටහන් තුළ සැලසුම් කර ක්‍රියාත්මක කළ හැකිය.

# ක්‍රියාකාරකම් සම්පාදනය

## පාසලේ සිදුවන බොහෝ කටයුතු ශිෂ්‍ය පාර්ලිමේන්තු සංකල්පය තුළට අනුගත කළ හැක.

අමාත්‍යාංශවල සක්‍රීය ක්‍රියාකාරීත්වය සඳහා පාසලේ සියලුම සිසු සිසුවියන් අමාත්‍යාංශ දහය නමින් ක්‍රියාත්මක වැඩසටහන් දහයට බෙදා වෙන් කිරීම වැදගත්ය. මෙම වැඩසටහන් අමාත්‍යාංශ දහයට සමගාමීව ක්‍රියාත්මක කෙරේ.

එසේම චක්‍රලේඛයේ සඳහන් පරිදි පාසලේ ආචාර්ය මණ්ඩලයේ සාමාජික, සාමාජිකාවන් අතර එක් එක් අමාත්‍යාංශ යටතේ අදාල ක්‍රියාකාරකම් බෙදා වගකීම් පැවරිය යුතුවේ. වෘත්තීමය වශයෙන්



## ක්‍රියාකාරකම් සම්පාදනය

ගුරුවරුන්ට මේ නිසා හිමි වන වරප්‍රසාද පිළිබඳ දැනුවත් කිරීමේ වගකීම මහලේකම් සතුය. ගුරු කාර්ය සාධනය, ගුරු උපහාර, පාසල් ප්‍රමිති ආදියේ දී මෙම ක්‍රියාකාරකම් වලට ගුරුවරයාගේ දායකත්වය ඇගයීමට ලක් කිරීම සිදු කල යුතුවේ.

පාසලක් තුළ ශිෂ්‍ය පාර්ලිමේන්තුව මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සැලසුම් කිරීමේ සටහන් උපලේඛන 1.1 යටතේ දක්වේ.

### 3.3 ක්‍රියාකාරකම් පෙළගැස්ම

අමාත්‍යංශ මගින් විවිධ ක්‍රියාකාරකම්, වැඩසටහන් සිදු කරන්නා සේම ඒ සඳහා මගපාදන පෙළගැස්ම ශිෂ්‍ය පාර්ලිමේන්තු සැසිවාරයන් තුලදී සිදු කිරීම වැදගත් ය.

ශිෂ්‍ය පාර්ලිමේන්තු සැසිවාර තුලදී (න්‍යාය පත්‍රයට ඇතුළත් කර) 'ප්‍රජාතන්ත්‍රවාදය' වන සංකල්පය වැනි ඉතා වැදගත් මාතෘකාවන් පිළිබඳව හරවත් සංවාදයන් ඇති කිරීමට පියවර ගැනීම සිදු කල යුතුය.

ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීම හා සුරැකීම පිළිබඳව අවැසි ප්‍රාථමික පෙළගැස්ම ඇරඹිය යුත්තේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවෙනි. එබැවින් එය වැදගත්, අනිවාර්ය අංගයක් ලෙස සලකා සාකච්ඡාවට ගැනීමට ක්‍රියාකිරීම මහලේකම් ප්‍රමුඛ විධායක කමිටුවේ වගකීමකි.

තවත් කාලීන වශයෙන් වැදගත් කමක් උසුලන ආපදා කළමනාකරණය, සෞඛ්‍ය හා පෝෂණය, අන්තර් පාසල් සුහදතා ගොඩනැගීම යනාදී වූ වැදගත් කරුණු පිළිබඳව ශිෂ්‍ය පාර්ලිමේන්තුව තුල සංවාදයක් ඇති කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම කල යුතු වන්නේය.

# දෙවන පරිච්ඡේදය

## ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන පාසල තුළත්, පාසල හා ප්‍රජාව සමගත්, පාසල හා රාජ්‍ය ආයතන සමගත්, පාසල හා රාජ්‍ය නොවන ආයතන සමගත් සම්බන්ධව ක්‍රියාත්මකවන පුලුල් ක්‍රියාකාරිත්වයකි. එපමණකදු නොව ශිෂ්‍යන් තුළ ශාරීරික, බුද්ධිමය, සමාජ හා සංස්කෘතික, ආවේදන, සාරධර්ම හා ප්‍රජාතාන්ත්‍රික අගයන් සංවර්ධනය කෙරෙන ක්‍රියාකාරීත්වයකි.

ශිෂ්‍ය පාර්ලිමේන්තු ක්‍රියාකාරකම් හුදෙක් දනුම, ආකල්ප, කුසලතා වර්ධනයට සීමානොවී ප්‍රායෝගිකව පාසල තුළ සමාජය තුළ මෙන්ම නිවස තුළත් පුරුදු පුහුණු වන ජීවන අත්දැකීමක් ලෙස සංවර්ධනය වීමට අවස්ථාවක් වනු ඇත.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී තමන් වැදගත් අයෙක් යන හැගීම සෑම ළමයෙකුටම ඇති වේ. එබැවින් සියලු විෂය සමගාමී ක්‍රියාකාරකමකදීම සාකච්ඡාව, විවිධ මතයන්ට ඇහුම්කන්දීම, සම්මුතිය, බහුතර මතයට එකගවීම, ඉවසීම, විනිවිදභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, බහු සංස්කෘතීන්ට ගරු කිරීම ආදී ගුණාංග අන්තර්ගත වීම ගැන අවධානය යොමු කිරීම වැදගත් වෙයි. ඒ තුළ හඳුනාගත් සමාජ අගතීන් බැහැර කරලීම කෙරෙහි විශේෂ අවබෝධයකින් කටයුතු සම්පාදනය වැදගත් කොට සලකන්නේ නම් අධ්‍යාපනයේ මූලික අරමුණු එලදායී ලෙස අත්කරගත හැකිය. එසේම ශිෂ්‍යයා, ගුරුවරයා මෙන්ම කළමනාකාරීත්වය, සමාජ ආර්ථික පසුබිම තුළින් පැන නගින ගැටලු මෙහිදී සාකච්ඡා කරේ. ඉන් නොනැවතී එම ගැටලු විසඳීමට යෝජනා ඉදිරිපත්වන හා ක්‍රියාත්මක වන යාන්ත්‍රණයක් බවට මෙය පත්කර ගත යුතු වේ.

## 2.1 අවධානය යොමු කළ යුතු කරුණු

1. ක්‍රියාකාරකමක් ප්‍රායෝගික තලයට ගෙන ඒමේදී චක්‍රලේඛයට අනුව පාර්ලිමේන්තු සැසිවාර, කැබිනට් මණ්ඩල රැස්වීම්, උපදේශක කාරක සභා, අනුකමිටු රැස්වීම් පැවැත්විය යුතු අතර අවශ්‍යතාව අනුව නව අනුකමිටු ඇතිකිරීම, රැස්වීම් පැවැත්වීම සිදුකල හැක. මෙම සියලු රැස්වීම්වලදී විධායක සභාවේ හා අනෙකුත් ගුරු භවතුන්ගේ සහභාගිත්වය අවස්ථාවෝචිතව තීරණය කරගැනීම කළ හැකිය.

2. පාසලේ සිදුවන සියලු ක්‍රියාකාරකම් වන විෂයානුබද්ධ, විෂය සමගාමී, විෂය බාහිර ආදී කරුණු ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ දී සාකච්ඡාවට ගත හැකිය. ඒ තුළින් පාසල තුළ සිදුකරනු ලබන අතිමහත් කාර්යභාරය ගැන සිසුන් තුළ අවබෝධයක් ජනිත වේ. පාසල යනු හුදු පන්තිකාමර ක්‍රියාවලියක් නොවන වගත් සෑම දෙයක් තුළම අරමුණක් හා දක්මක් පවතින සංකීර්ණතාවකින් යුතු බවත් ඔවුන්ට අවබෝධයට ගත හැකි වනු ඇත. එසේ ම දෙමාපියන්, ආදි සිසු සිසුවියන්, ප්‍රජාව ආදී සියල්ලන් තුළ පුලුල් අවබෝධයක් හා ඇති වේ.

3. සියලු ශිෂ්‍ය නියෝජිතයින් ආරම්භයේ සිට සෑම වැදගත් ක්‍රියාකාරකමක්ම, උපදේශක්ම දින වකවානු සහිතව ක්‍රමානුකූලව හා නිර්මාණාත්මකව සටහන් තබා ගැනීමට වාර්තා සටහන් පොතක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. මෙම ලිඛිත සටහන් තබා ගැනීමේ නිර්මාණාත්මකභාවය ඇයගේ/ඔහුගේ පෞද්ගලික දක්ෂතාව මත සිදුවන බව සිහියේ තබා ගත යුතුය. ඒ සඳහා නව තාක්ෂණය භාවිතයට ද දිරිගැන්වීම සිදුකළ හැකිය.

4. සියලු ශිෂ්‍ය මන්ත්‍රීවරියන්ට හා මන්ත්‍රීවරුන්ට ආරම්භයේ සිට තම ශිෂ්‍ය පාර්ලිමේන්තුවට අදාලව හා අවම වශයෙන් තම විෂය පථයට අදාල ශාස්ත්‍රීය තොරතුරු රැස්කර තබා ගැනීම අවශ්‍යතාවයකි. (ශාස්ත්‍රීය ලිපි, වාර සඟරා, පොත්පත්)

## 2.1 අවධානය යොමු කළ යුතු කරුණු

5. සෑම ශිෂ්‍ය මන්ත්‍රීවරියක්ම/වරයෙක්ම ශිෂ්‍ය පාර්ලිමේන්තුවෙහි ගෞරවයත් පාසලේ ගෞරවයත් රැකෙන පරිදි කටයුතු කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි. එසේ නොවන විට ඒ සම්බන්ධව විනයානුකූල ක්‍රියාකිරීමේ වගකීම විධායක මණ්ඩලය සතු වේ.

6. ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කුමන කාර්යයකදීවත් රටේ පවතින දේශපාලන පක්ෂවල හා දේශපාලනඥයන්ගේ පෞද්ගලික වාසියට හේතුවන ලෙස කටයුතු නොකළ යුතු බව සියලු දෙනා මතක තබා ගත යුත්තකි.

7. ශිෂ්‍ය පාර්ලිමේන්තු සැසිවාරයක් මසකට එක්වරක් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

8. එක් සභා වාරයේදී පසුගිය කාලය තුළ සිදුකළ ක්‍රියාකාරකම්, ඒවායේ ප්‍රගතිය, වැය ශීර්ෂ සාකච්ඡා කළ හැකිය. එසේම සිසුන්ට ද ඒවා ප්‍රශ්න කිරීමට හැකි වනු ඇත. එසේම ඉදිරියේ සිදු කිරීමට නියමිත වැඩසටහන් පිළිබඳ යෝජනා, අවශ්‍ය සම්පත් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට ඒවා සංශෝධනට ශිෂ්‍යන්ගේ විවෘත අදහස් ලබා ගත හැකිය. ඒ තුළින් එම වැඩ තමන්ගේම වැඩක් යැයි යන හැඟීම ඔවුන් තුළ ඇති වේ.

9. සෑම විෂය සමගාමී ක්‍රියාකාරකමක්ම ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කුමන හෝ අමාත්‍යාංශයකට හෝ කිහිපයකට පැවරීම වඩාත් ප්‍රතිඵල දායකය. එවිට එම අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශ කිහිපයට සම්බන්ධ උපදේශක ගුරු මහත්ම මහත්මීන්, ශිෂ්‍ය මන්ත්‍රීවරියන්/වරු හා එම අමාත්‍යාංශයට සම්බන්ධ සෑම පන්තියකම සිසුන් සක්‍රීයව එයට සම්බන්ධ වේ. එසේම එය කෙරෙහි සෑමගේ වගවීමේ ස්වභාවය හා වගකීමේ සංකල්පය යථාර්ථයක් බවට පත්වේ.

## 2.1
## අවධානය යොමු කළ යුතු කරුණු

10. පාසලේ වාර්ෂික ලිත සකස් කිරීමේදී එහි අන්තර්ගත ක්‍රියාකාරකම් අවශය පරිදි ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන සමග සමෝධානය කර ගැනීම වැදගත් වේ.

11. පාසලේ සැලසුම් කළ සියලු විෂය සමගාමී ක්‍රියාකාරකම් සියල්ලන්ටම දැනගත හැකි වන පරිදි පාසලේ ප්‍රදර්ශනය කිරීම වැදගත් වේ. මේ සඳහා

    i. නිල දැන්වීම් පුවරුව භාවිත කිරීම

    ii. පාසල් වෙබ් අඩවියේ ඇතුලත් කිරීම

    iii. පාසල් සතු නිල සමාජ ජාලා පිටු තුළ හා ගිණුම් තුළ ප්‍රදර්ශනය

    ආදී විවිධ ක්‍රම අනුගමනය කළ හැකිය.

12. මෙම ක්‍රියාකාරකම් ගුරුභවතුන්ගේ ක්‍රියාමූලික පර්යේෂණයක් බවට පත් කරමින් ශාස්ත්‍රීය අධ්‍යයනයන් සඳහා ද යොමු කළ හැකිය.

**ශිෂ්‍ය පාර්ලිමේන්තුව පවත්වාගෙන යාමේදී තබාගත යුතු ලිපි ලේඛන,**

- වීඩියෝ
- ඡායාරූප
- න්‍යාය පුස්තක
- සැලසුම්
- ක්‍රියාවට නංවන වැඩසටහන්වල වාර්තා
- ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිත වාර්තා
- හැන්සාඩ් වාර්තා
- ආකෘති පත්‍ර
- පාර්ලිමේන්තු බිත්ති පුවත්පත

## 2.2
## ක්‍රියාත්මක කිරීම

ඒ අනුව සෑම විෂය සමගාමී ක්‍රියාකාරකමක්ම මූලික අදියර 03 කින් සැලසුම් කරලීමට මතක තබාගැනීම වැදගත් වේ. ඒවා

i. පෙර සැලසුම Pre Arrangement

ii. වැඩසටහන් දිනය හෝ වැඩසටහන සිදුවන වේලාව

iii. වැඩසටහනින් පසු ක්‍රියාවලිය

ඒ ඒ අදියර සඳහා සිදුවිය යුතු ක්‍රියාකාරකම් පරිසරය ආදී හේතු මත වෙනස් වෙයි. නිශ්චිත ලෙසම ඒ ඒ අදියර සඳහා ඇතුළත් වියයුතු අංග සංවිධායකයන් සාකච්ඡා කර තීරණය කළ හැකිය. පහත සඳහන් වන්නේ ඒ ඒ අදියරට ඇතුලත් විය යුතුයැයි කිව හැකි දළ අදහස් කිහිපයක් පමණි. වැඩසටහන ආරම්භ කිරීමට පෙර ව්‍යාපෘති වාර්තාවක් සකස් කළ යුතුය.

## 2.3
## වැඩසටහනින් පසු ක්‍රියාකාරකම්

1. සියලු ක්‍රියාකාරකම් සිදුවූ ආකාරය පිළිබඳ ආඛ්‍යාන වාර්තාවක් (Narrative Report) සැකසීමෙන් සිදුවූ ක්‍රියාවලිය ගැන පුලුල් අවබෝධයක් ලබාගත හැකිය.
2. සමස්ථ ක්‍රියාකාරීත්වයේ විවිධ උපක්‍රියාකාරකම් සඳහා වෙන වෙනම ලිපි ගොනු තබා ගැනීම අතිශය වැදගත්ය.
3. සෑම ගුරුභවතෙක්ම තමාගේ කාර්ය කොටස ලිපිගොනුවක තබා ගැනීමත් එම කාර්යයන් කාර්ය සාධනය තුලට ඇතුලත් කිරීමටත් හැකි වේ.
4. එසේම සිසුන්ද තමාගේ පුරුද්දක් ලෙස තමා සම්බන්ධ කාර්ය පිළිබඳ විශේෂ පාසල් ක්‍රියාකාරම් සම්බන්ධ වාර්තාවක තබා ගැනීම වැදගත්ය. මන්ද අනාගතයේදී නායකත්ව ආදී සම්මුඛ පරීක්ෂණවලදී ද ඉදිරිපත් කිරීමට භාවිත කළ හැකිය.

## 2.3 වැඩසටහනින් පසු ක්‍රියාකාරකම්

5. ක්‍රියාකාරකමට අදාල ඡායාරූප, වීඩියෝ, සද්ධි අධ්‍යන, මාධ්‍ය ආවරණ, සමාජ ජාලා වෙත මුදා හැරීම්, ආදිය ගැන සැලකිලිමතත් වීම.
6. සෑම ක්‍රියාකාරකම සියලු තොරතුරු ලිඛිතව තබා ගැනීම හා හැකි මට්ටමින් එම තොරතුරු ඊ තාක්ෂණය භාවිතයෙන් ගබඩා කිරීම හා හුවමාරු කිරීම වැදගත් වෙයි.
7. පසු විපරම් ක්‍රමවේදයක් අත්‍යවශ්‍ය වේ. මෙහිදී උගත් පාඩම් කෙරෙහි විශේෂ අවදානයක් දැක්වීම වැදගත් වේ.
8. සෑම වැඩසටහනක්ම ලොග් සටහන් තබා ගැනීම
9. සෑම වැඩසටහනක් අවසානයේම ඒ සඳහා සහභාගී වූ ආරාධිතයන්ට හා දායකත්වය ලබා දුන් අයට ස්තුති ලිපි යැවීම
10. අය-වැය වාර්තාව ප්‍රදර්ශනය කිරීම

ක්‍රියාකාරකම් වාර්තාකරණය,

## 2.4 අධීක්ෂණය

මෙම අධීක්ෂණ ක්‍රියාවලියද ප්‍රධාන ආකාර දෙකකින් සිදු වේ. එනම්

1. අභ්‍යන්තර අධීක්ෂණය
2. බාහිර අධීක්ෂණය

   අභ්‍යන්තර අධික්ෂණය ද කිහිප ආකාරයකින් සිදු කළ හැකිය.

**ස්වයං අධීක්ෂණය**

ඒ ඒ ක්‍රියාකාරකම් වල වගකීම් භාරගත් අය තම කාර්ය නිවැරදිව සිදුවේ දැයි සොයා බැලිය යුතුය. සිදුවනවාදැයි

තමාම බැලිය යුතුය. එය තනි තනිව හෝ කණ්ඩායමක් ලෙස සිදුකළ හැකිය. ස්වයං අධීක්ෂණ පත්‍රිකාවක් යොදා ගැනීම එම ක්‍රියාවලිය පහසු කරයි.

2. පාසල් අධීක්ෂණ කමිටුවක් පත් කිරීම.

   මෙහි දී ගුරුභවතුන්, සිසුන් හා දෙමාපියන්ද ඇතුලත්වන පරිදි කමිටුවක් පත් කර ගත හැකිය.

3. ක්‍රියාකාරකමෙහි වගකීම් භාර ප්‍රධාන ගුරු භවතාගේ අධීක්ෂණය

   සෑම අංශයක් කෙරෙහි අදාල ගුරු භවතා අධීක්ෂණය කළ හැකිය. එසේම ස්වං අධීක්ෂණ පත්‍රිකා පරීක්ෂාවෙන් හා අධීක්ෂණ කමිටුවේ අධීක්ෂණ පත්‍රිකා පරීක්ෂාවද සිදු කිරීමෙන් වේගවත්ව එම ක්‍රියාවලිය සිදුකළ හැකිය.

4. මෙම ශිෂ්‍ය පාර්ලිමේන්තුව පාසලේ ප්‍රමිතියක් බවට පත් කිරීම මගින් අධික්ෂණය

5. විෂය සමගාමී ප්‍රමිතිය යටතේ අධීක්ෂණය

6. නියෝජ්‍ය විදුහල්පතිගේ හා විදුහල්පතිගේ අධීක්ෂණය

### බාහිර අධීක්ෂණය

1. කොට්ඨාස, කලාප හා පළාත අධීක්ෂණය

   මෙය ප්‍රමිති 08 ප්‍රධාන අධීක්ෂණ ක්‍රියාවලියේ දී විශේෂ අවධානයට යොමුකිරීම අවශ්‍ය වේ.

2. පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ හා රේඛීය අමාත්‍යංශයේ අධීක්ෂණය

   පළාත් මට්ටමින් පාසල් අයත් පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්වරයාගේ අධීක්ෂණයටත්, ජාතික මට්ටමින් අධ්‍යාපන

අමාත්‍යංශයේ විෂය සමගාමී ඒකකයේ හා අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්ගේ අධීක්ෂණයට ලක් වේ.

- මෙම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආයතනගත අධීක්ෂණය සේම ඊට පරිබාහිරින් ඍජු සහ වක්‍ර ආකාරයෙන් මැතිවරණ කොමිසම් සභාවේ, විගණන සේවා කොමිසම් සභාවේ හා වෙනත් රාජ්‍ය - රාජ්‍ය නොවන ආයතනවල හා පුද්ගලයන්ගේද අධීක්ෂණයන්ට ද ලක් වන්නක් වේ.

## තෙවන පරිච්ඡේදය

## ඇගයීම

මෙය ප්‍රධාන අංශ දෙකක් යටතේ සිදු කළ හැකිය, එනම්,

01 ස්වයං ඇගයීම

02 බාහිර ඇගයීම් වශයෙනි,

**ස්වයං ඇගයීම -**

මෙය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිතයන් විසින්ම සිදු කළ යුත ය. තමා විසින් පාර්ලිමේන්තු ධූර කාලය තුළදී පාසලට, නිවසට හා සමාජයට ඉටු කරන ලද වගකීම් ඇසුරින් මෙම ඇගයීම සිදු කළ යුතු ය.

මේ සඳහා පහත සඳහන් ආකෘතිය අදාළ කරගත හැකි ය.

ශිෂ්‍ය පාර්ලිමේන්තුව/ ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩ සටහන්වල තමන්ගේ නියෝජනත්වය

01. සමාජික -
02. නියෝජිත -
03. අමාත්‍ය/නියෝජ්‍ය අමාත්‍ය -
04. ප්‍රධාන තනතුරුලාභි -

| | | ඉතා හොඳයි | හොඳයි | සංවර්ධනය විය යුතුයි |
|---|---|---|---|---|
| 01 | මා හට ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති දැනුවත්භාවය. | | | |
| 02 | මම මැතිවරණ පොරොන්දු නිසි ලෙස ඉදිරිපත් කළෙමි. | | | |
| 03 | මම තේරිපත් වූ අමාත්‍යාංශය පිළිබඳ මම දරන අදහස | | | |
| 04 | අමාත්‍යාංශය යටතේ මම ඉටුකළ කාර්යයන් පිළිබඳ මා දරන අදහස | | | |

## තෙවන පරිච්ඡේදය

## ඇගයීම

| | | ඉතා හොඳයි | හොඳයි | සංවර්ධනය විය යුතුයි |
|---|---|---|---|---|
| 05 | මම මගේ අමාත්‍යාංශය යටතේ පහත කාර්යයන් ඉටු කළෙමි.<br>I.................................................<br>II................................................<br>III...............................................<br>IV................................................<br>V................................................. | | | |
| 06 | මම ඉටු කළ ඉහත කාර්යයන් නිසා පාසලට හා පාසල් ප්‍රජාවට ඉටු වූ සේවය | | | |
| 07 | ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිතයකු ලෙස මාගේ ජීවිතයට අතිකරගත් ඉලක්ක සහ ජයග්‍රහණ<br>I. ...............................................<br>II. ..............................................<br>II. ..............................................<br>IV. ..............................................<br>V. ............................................... | | | |

- අදාළ ස්ථානයේ √ යෙදීම තුළින් තමා ඇගයීමට ලක් කිරීම කළ හැකිය.
- මෙහි පිටපතක් සෑම දරුවෙකුටම ලබා දී එය පොතකට අලවා ළමයාගේ තොරතුරු ඇතුළත් ලොත් පොතක් ලෙස භාවිත කිරීමට කටයුතු කිරීම ඉතා හොඳයි.
- මාසයකට වතාවක් මෙම ලොත් පොත නියෝජ්‍ය මහ ලේකම් තිදෙනා පරික්ෂා කොට අත්සනක් යෙදීම ඉතා සුදුසුයි.

# බාහිර ඇගයීම

බාහිර ඇගයීම් ප්‍රධාන අංශ ගණනාවක් යටතේ සිදු කිරීම වඩා යෝග්‍ය වේ. එසේම මෙම ඇගයීම පාසල් මට්ටමින්, කොට්ඨාශ හා කලාප මට්ටමින් සිදු කළ හැකිය.

හැකි සෑම අවස්ථාවකම ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයින්ට ධනාත්මක ප්‍රතිචාරයක් ලැබෙන අන්දමට ඇගයීම සිදුකිරීම වැදගත් වෙයි.

මේ සඳහා පහත ආකෘතිය යොදා ගත හැකිය.

1. ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයාගේ නම :-
2. ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ දරන තනතුර :-
3. භාර අමාත්‍යාංශය :-

| ඇගයුම්කරු | චර්යා රටාවන් හා දර්ශක | ඉතා හොඳයි | හොඳයි | සතුටුදායකයි | ඇගයුම්කරුගේ අත්සන, මුද්‍රාව හා සංවර්ධනය විය යුතු කරුණු/අංශ |
|---|---|---|---|---|---|
| පන්තිභාර ගුරුතුමා | 1. පන්ති කාමරය තුළ දී සෙසු සිසුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. | | | | |
| | 2. පන්ති කාමරයේ පොදු වැඩවල දී දක්වන දායකත්වය | | | | |
| | 3. උගන්වන ගුරු භවතුන්ට ගරු කිරීම. | | | | |
| | 4. පාසල තුළ දී තම දෙමාපියන්ට හා පාසලට පැමිණෙන අනෙක් වැඩිහිටියන්ට දක්වන ගෞරවය හා පිළිගැනීම. | | | | |
| | 5. විෂය සමගාමී කටයුතු වලදී දක්වන දායකත්වය | | | | |
| | 6. පාසලේ පොදු වැඩවල දී (ක්‍රීඩා උත්සව/ වෙනත් විශේෂ දින ආදියේ දී) දක්වන දායකත්වය | | | | |

| ඇගයුම්කරු | චර්යා රටාවන් හා දර්ශක | ඉතා හොඳයි | හොඳයි | සතුටුදයකයි | ඇගයුම්කරුගේ අත්සන, මුද්‍රාව හා සංවර්ධනය විය යුතු කරුණු/අංශ |
|---|---|---|---|---|---|
| නියෝජ්‍ය මහ ලේකම්වරු | 1. පාසලේ දී ශිෂ්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදයන්ට අනුකූලව හා අනුගතව කටයුතු කිරීම. | | | | |
| | 2. විධායක ශ්‍රේණියේ නිලධාරීන් හා අනෙකුත් නියෝජිතයන් සමඟ සාමූහිකවයෙන් කටයුතු කරයි. | | | | |
| | 3. පොදු වැඩවල දී කටයුතු කිරීම හා ක්ෂණික තීරණ ගැනීමේ දී දක්වන දායකත්වය | | | | |
| | 4. ලිපි ගොනු පවත්වා ගැනීම හා අනෙකුත් නියෝජිතයින් ඒ සඳහා යොමු කිරීම. | | | | |
| | 5. අවට පරිසරය පිරිසිදු කර ගැනීම / අලංකාර කර ගැනීම/ නඩත්තු කිරීම පාසල ප්‍රියජනක ස්ථානයක් බවට පත් කර ගැනීමට කටයුතු කිරීම. | | | | |
| | 6. ශිෂ්‍ය පාර්ලිමේන්තුව නියෝජනය කරන ශිෂ්‍යයෙකු / ශිෂ්‍යාවක ලෙස ඇති අභිමානය | | | | |
| මහ ලේකම් | 1. පාසලේ සියලු කාර්යයන් වල දී සහ පෞද්ගලික කටයුතු වල දී දක්වන සක්‍රීය දායකත්වය | | | | |
| | 2. සමාජීය යහපත් පුරවැසියෙකු ලෙස කටයුතු කිරීම | | | | |

## කලාප ඇගයීම්

1. ඇගයුම්කරුගේ අදහස් හා නිර්දේශයන් :-

   i. ..................................................................................................................

   ii. ..................................................................................................................

   iii. ..................................................................................................................

   iv. ..................................................................................................................

   v. ..................................................................................................................

................................ ............................................
දිනය අත්සන / මුද්‍රාව
(ඇයදුම්කරුගේ නම)

---

## පළාත් ඇගයීම්

1. ඇගයුම්කරුගේ අදහස් හා නිර්දේශයන් :-

   i. ..................................................................................................................

   ii. ..................................................................................................................

   iii. ..................................................................................................................

................................ ............................................
දිනය අත්සන / මුද්‍රාව
(ඇගයුම්කරුගේ නම)

# පසු විපරම



ශිෂ්‍ය පාර්ලිමේන්තුව හඳුන්වාදීමේ මූලික අරමුණ වන්නේ නිර්මාණශීලී හා සංයමයකින් යුතු පුරවැසියන් බිහි කිරීමයි. ශිෂ්‍යයාට නව ලොවට ගැලපෙන සේ ක්‍රමානූකූලව හැඩගැසීමට මේ තුළින් අවස්ථාව ලැබේ.

නායකත්වය හා කළමනාකරණය සඳහා ශිෂ්‍යයාට අවශ්‍ය මාර්ගෝපදේශනය සැපයීම ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මූලික කාර්යයකි.

ශිෂ්‍ය පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වය මගින් ලබාගන්නා අත්දැකීම් තුළින් ශිෂ්‍යයාට ළඟා කරගත හැකි හා වැඩි දියුණු කරගත හැකි සාරධර්ම රාශියකි.

හඳුනාගත් පහත අවස්ථාවන් ළඟා කර ගැනීමට ශිෂ්‍යයාට අවස්ථාව තිබේ.

- නායකත්වයට හුරු වෙයි, දක්ෂ නායකයෙකු බිහි කරයි.
- නායකත්වයට ගරු කරයි.
- අන්‍ය මත ඉවසයි.
- කාලීන අවශ්‍යතා මත හැඩ ගැසීමට හා යාවත්කාලීන වීමට මෙතුළින් මාර්ගය සලසයි.
- සහයෝගයෙන් කටයුතු කරයි.
- ගෝලීය වෙනස්වීම් හමුවේ හුදකලා නොවූ සමාජයීය පුරවැසියකු නිර්මාණය කරයි.
- වගකීම හා වගවීම අවබෝධ වෙයි.
- ජනතා පරමාධිපත්‍ය බලය පිළිබඳ අවබෝධයක් ලබාගනියි.
- අන්තර් සහයෝගයෙන් කටයුතු කිරීමෙන් ශිෂ්‍ය අභිප්‍රේරණය ගොඩනගා ගනියි.
- පාසල සියලු දරුවන්ට ප්‍රියජනක ස්ථානයකි.
- සෑම දරුවෙකුටම පාසල තම අදහස් ප්‍රකාශයට පත් කළ හැකි නිදහස් ස්ථානයකි.
- සෑම ශිෂ්‍යයෙකුටම අන්‍යයන්ගේ ශක්‍යතාවන් වැඩිදියුණු කළ හැකිවේ.

## පසු විපරම

- සෑම ශිෂ්‍යයෙකුම සහකම්පනයෙන් හා සහානුභූතියෙන් කටයුතු කරයි.
- පාසල් ප්‍රජාව හා පාසලින් පරිබාහිර අන්තර් ප්‍රජාව තුළ යහපත් සම්බන්ධතා ගොඩ නැගීමට දායක වෙයි.



# තෙවන පරිච්ඡේදය

## ශිෂ්‍ය පාර්ලිමේන්තු සංවාදාත්මක මානයන්...

ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන යටතේ දැනට හඳුනාගෙන ඇති එම අංශ යටතට පහත සඳහන් මාතෘකාද ඇතුළත් කරන්න.

1. සැබෑ නායකයෙකු සතුව තිබිය යුතු ගුණාංග සාකච්ඡා කරන්න./ ක්‍රියාකාරකම්

2. පුරවැසියෙකු සතු සමාජ වගකීම් හා යුතුකම් සාකච්ඡා කරන්න. එය කොටස් කිහිපයකට බෙදාගන්න. (විවෘත, සාකච්ඡාවකට ඉඩකඩ ලබාදෙන්න.)
   I. ශිෂ්‍යයෙකු ලෙස/දරුවෙකු
   II. තරුණයෙකු ලෙස
   III. වැඩිහිටියෙකු ලෙස
   IV. තම වෘත්තිය ලෙස පාසලේ විවිධ භූමිකාව තුළ
   V. සමාජ නායකයෙකු ලෙස

3. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය හා එය ක්‍රියාත්මක වන ආකාරය සාකච්ඡා කරන්න.

4. ලංකාවේ ක්‍රියාත්මක වන මහජන නියෝජිත ආයතන
   I. පළාත් පාලන ආයතන
   II. පළාත් සභා
   III. පාර්ලිමේන්තුව
   IV. ජනාධිපතිවරයා

5. මෙම මහජන නියෝජිත ආයතන සඳහා තෝරා පත්කරගැනීම සිදුකරන මැතිවරණ ක්‍රම පිළිබඳව සාකච්ඡා කරන්න.

6. ජාතික මැතිවරණ හෝ ශිෂ්‍ය පාර්ලිමේන්තු මැතිවරණයක /ඕනෑම මැතිවරණයක තිබිය යුතු මූලික ගුණාංග සාකච්ඡා කරන්න.

7. මැතිවරණයක තිබිය යුතු මූලික ලක්ෂණ:
   I. මූලික සුදුසුකම් සපුරා තිබෙන ඕනෑම පුරවැසියෙකුට (ජාති, ආගම්, කුල භේදයකින් තොරව) අයෙකුට තරග කිරීමේ ඉඩකඩ
   II. අපේක්ෂකත්වය ලබාදෙන සියලුම දෙනාට තරග කිරීම සඳහා සමබිමක්
   III. මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම පුරවැසියන්ට ඡන්ද භාවිත කිරීම සඳහා බාධාවකින් තොරව සමාන ඉඩකඩක්
   IV. නීතිය සෑම අපේක්ෂකයෙකුටම සමාන ලෙස ක්‍රියාත්මක වීම
   V. රාජ්‍ය බලය හෝ දේශපාලන බලය අපේක්ෂකයන්ට වාසි සහගත ලෙස හෝ අවාසි සහගත ලෙස ක්‍රියාත්මක නොවීම
   VI. මාධ්‍යය සෑම අපේක්ෂකයෙකුටම සමාන ලෙස සැලකීම

8. එක් එක් මහජන නියෝජිත ආයතන වල නියෝජිතයන්ගේ කාර්යභාරය සාකච්ඡා කරන්න.
   I. ජනාධිපතිවරයා
   II. පාර්ලිමේන්තුව /මන්ත්‍රීවරු
   III. පළාත් සභා /මන්ත්‍රීවරු
   IV. පළාත් පාලන ආයතන

9. එක් එක් ආයතනවල කාර්යභාරය අනුව මහජන නියෝජිතයන් තේරීමේදී පුරවැසියන් සලකා බැලිය යුතු කරුණු පිළිබඳව සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම් සඳහා යොදවන්න.

# උප ලේඛන



| ක්‍රියාකාරකම | අපේක්ෂිත අරමුණ | ක්‍රියා පිළිවෙත | සහය ලබා ගත හැකි වෙනත් අමාත්‍යාංශ හා වැඩසටහන් |
|---|---|---|---|
| පාසල් පරිසරය ප්‍රියමනාප අලංකාර සහ ඉගෙනුම් පරිසරයක් ලෙස නිර්මාණය කිරීම. | • ශිෂ්‍ය මිත්‍රත්ව පාසල් පරිසරයක්, ශිෂ්‍ය ප්‍රජාවගේ මූලිකත්වයෙන් ගොඩනැගීම.<br>• පරිසර හිතකාමී අලංකාර පරිසරයක් ශිෂ්‍ය සහභාගීත්වයෙන් ගොඩනැගීම.<br>• පරිසර හිතකාමී ශිෂ්‍ය ප්‍රජාවක් නිර්මාණය සඳහා අවශ්‍ය පසුබිම ගොඩනැගෙනු ඇත. | • පරිසර සංරක්ෂණය, පරිසර අලංකරණය පිළිබඳ දේශන වැඩමුළු සංවිධානය කිරීම<br>• පාසල් පරිසරය නිරීක්ෂණය කරමින් පාසල් පරිසරය අලංකරණය පිළිබඳ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අදහස් යෝජනා ලබා ගැනීම<br>• මෙම නිරීක්ෂණයේදී පාසල් පරිසරයේ වර්තමාන තත්වය පිළිබඳව ගවේෂණාත් -මකව එම නිරීක්ෂණය කිරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමු කළ යුතුවේ.<br>උදා - පාසලේ ඇති ඒක දේශීය ශාඛ, පරිසරයෙන් වඳවී යාමේ තර්ජනයට මුහුණ දෙන ශාඛ, පාසලේ ඇති මල් වර්ග, සුවඳ දෙන මල් වර්ග, ඵල සහිත හා ඵල රහිත ගස් වර්ග මේවා පිළිබඳ සංඛ්‍යාත්මකව අධ්‍යනය කිරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් පෙළඹිය යුතු වේ. | |

# උප ලේඛන



| ක්‍රියාකාරකම | අපේක්ෂිත අරමුණ | ක්‍රියා පිළිවෙත | සහය ලබා ගත හැකි වෙනත් අමාත්‍යාංශ හා වැඩසටහන් |
|---|---|---|---|
| පාසල් පරිසරය ප්‍රියමනාප අලංකාර සහ ඉගෙනුම් පරිසරයක් ලෙස නිර්මාණය කිරීම. | • ශිෂ්‍ය මිත්‍රත්ව පාසල් පරිසරයක්, ශිෂ්‍ය ප්‍රජාවගේ මූලිකත්වයෙන් ගොඩනැගීම.<br>• පරිසර හිතකාමී අලංකාර පරිසරයක් ශිෂ්‍ය සහභාගීත්වයෙන් ගොඩනැගීම.<br>• පරිසර හිතකාමී ශිෂ්‍ය ප්‍රජාවක් නිර්මාණය සඳහා අවශ්‍ය පසුබිම ගොඩනැගෙනු ඇත. | • අනතුරුව ඔවුන්ගේ පරිසර සැලැස්මට ඉහත තේමාවන් ඔස්සේ මෙම ශාඛ සංරක්ෂණය, පක්ෂීන්ගේ ආගමනය, අලංකරණය, වඳවන ශාඛ ආරක්ෂා වන පාසල් පරිසර උද්භිධාගාර කෞතුකාගාරයක් ලෙස පාසල් පරිසර පවත්වාගෙන යාම පිළිබඳව හා ඒවා ඉලක්ක හා අරමුණු පැහැදිලි කිරීම.<br>• එම යෝජනා සැළකිල්ලට ගනිමින් සියලුම ශිෂ්‍යයන්, අමාත්‍යාංශ, වැඩසටහන්වල ශිෂ්‍ය නියෝජිතයන්, වැඩසටහන් සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් හා ගුරුවරුන්ගේද දායකත්වයෙන් පරිසර අලංකරණය හා සම්බන්ධ කමිටුවක් පත්කර ගැනීම.<br>• ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලබාදුන් යෝජනාද සැළකිල්ලට ගනිමින් පාසල සඳහා පරිසර අලංකරණ සැලැස්මක් සැකසීම. | |

## ක්‍රියාකාරකම

## ඩෙංගු මර්ධන වැඩසටහන

## අරමුණ හඳුනා ගැනීම

ශ්‍රී ලංකාව ඩෙංගු රෝගයෙන් තොර රටක් බවට පත් කිරීම.

රෝගය පිළිබඳ පාසල් ළමුන් සහ ප්‍රජාව දැනුවත් කිරීම.

රෝගය ව්‍යාප්ත වීමට හේතුව මිනිසාගේ අයහපත් චර්යාවන් බව හඳුන්වා දීම.

ආත්මාර්ථයෙන් තොරව සහකම්පනයෙන් යුක්තව වැඩසටහනට දායක වීම.

සැලකිය යුතුයි:

මෙම ක්‍රියාකාරකම මධ්‍යකාලීන වන අතර ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශ හඳුන්වාදීම්, කාල සටහන,

| වැඩ සටහන | මාතෘකාව | මුළු කාලය |
|---|---|---|
| | හැඳින්වීම, අපේක්ෂණ | |

| | |
|---|---|
| | **පියවර 1 - හැඳින්වීම**<br>ලබාගත් තොරතුරු ඉදිරිපත් කිරීම සටහන් පත්‍රිකාව ' Power Point හැඳින්වීම.<br>**පියවර 2 - අපේක්ෂණ සහ කාල සටහන්**<br>• කාල සටහන ඉදිරිපත් කිරීම<br>• අපේක්ෂණ (කණ්ඩායමකට 4 බැගින් වූ කට්ටලයක්)<br>**පියවර 3 - අදාළ අමාත්‍යාංශ සඳහා කාර්යයන් වෙන් කිරීම**<br>**පියවර 4 - වැඩමුළුවකදී එක් එක් අමාත්‍යාංශ වල අදහස් විමසීම** |

## ක්‍රියාකාරකම

## ඩෙංගු මර්ධන වැඩසටහන

## අරමුණ හඳුනා ගැනීම

| ප්‍රතිඵල | අවසානයේදී සහභාගී වන්නන් දැනගත යුතු කරුණු |
|---|---|
| | • ලැබී ඇති ක්‍රියාකාරකමෙහි වැදගත්කම එහි අපේක්ෂිත වෙනස ඇති කිරීමට ශිෂ්‍ය පාර්ලිමේන්තුව සතු හැකියාව.<br>• එක එක් අමාත්‍යාංශයට අයත් කාර්යය භාරය සහ අවසන් ප්‍රතිඵලය ලබා ගැනීමට අනුගමනය කළ යුතු පිළිවෙල. |

**සටහන -**

හඳුන්වාදීම, අපේක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සහභාගී වන්නන්ට අමාත්‍යාංශ අනුව අසුන් ගැනීමට ඉඩදීම ප්‍රයෝජනවත්ය. වැඩසටහන ආරම්භ කිරීමට මොහොතකට පෙර කණ්ඩායම් වල සාමාජිකයින් වැඩි හෝ අඩුනම් එය සමබර කිරීම අවශ්‍ය විය හැකියි. තමන් දන්නා හඳුනන තම අමාත්‍යාංශයේ අය සමග අසුන් ගැනීමට නැඹුරු වීමෙන් සිය සහායකයින්, මිතුරන් සමග මෙම ක්‍රියාකාරකම් කිහිපයේ යෙදීමෙන් පහසු වාතාවරණයක අන්‍යොන්‍යව කටයුතු කිරීමට සහ වඩාත් පුළුල් වූ වැඩමුළු අන්තර් ක්‍රියාවලට පහසුවෙන් යොමුවිය හැකිය. සටහන් තැබීම සඳහා ලිපි ද්‍රව්‍ය සැපයීම කළ යුතුය.



ක්‍රියාකාරකම් 1 -

**පිළිගැනීම් සහ හඳුනාගැනීම**

**වැඩමුළුවට සහභාගීවන්නන් පිළිගැනීම**

a. මෙම වැඩමුළුව මනා සහභාගීත්වයකින් පැවැත්වීම අපගේ අරමුණ බව පැහැදිලි කරන්න. එබැවින් සියලුදෙනාම අහඹු ලෙස හඳුනා ගැනීමේ ක්‍රියාකාරකමක් අරඹන බව පහදා දෙන්න. සියලු දෙනාම එකම පාසලේ ශිෂ්‍යයින් නිසා මෙම පියවරට වැඩි වේලාවක් ගත කිරීම අවශ්‍ය නොවේ.

තොරතුරු පත්‍රිකා ප්‍රදර්ශනය ' Power Point දැක්වීම.

1. ඔබගේ නම කුමක්ද? පන්තිය කුමක්ද? ඩෙංගු රෝගය පිළිබඳ ඔබ දැනුවත්ද?

ඔබ දන්නා කෙනෙක් රෝගයට ගොදුරු වී ඇත්ද? එම අවස්ථාවේදී ඔබ සහ ඔබේ පවුලේ අයගේ හැසිරීම කෙබඳු වීද? ඒ අවස්ථාවේදී ඔබ බියට පත්වූයේද? එසේ නම් එයට හේතු මොනවාද? මෙම ප්‍රශ්න භාවිතා කරමින් ක්‍රියාකාරකමෙහි මුල් පියවර ආරම්භ කරන්න.

## ක්‍රියාකාරකම් 2 -

### අපේක්ෂණ

| | |
|---|---|
| A4 වර්ණ කඩදාසි - කණ්ඩායමක 4 බැගින් | a. මෙම ක්‍රියාකාරකමෙහි දී සහභාගී වන්නන්ට සිය දැනුම ඵලදායී ලෙස යෙදීමට සහ අවශ්‍ය දේ ඉගෙන ගැනීමට කටයුතු යොදන බව විස්තර කරන්න.<br><br>මෙම ක්‍රියාකාරකමෙන් ඔබ අපේක්ෂා කරන්නේ කුමක්ද? විමසන්න.<br><br>ක්‍රියාකාරකමෙහි දී ඔබට ඉටු කිරීමට අවශ්‍ය දේ පිළිබඳව අමාත්‍යාංශ කණ්ඩායම සමග සාකච්ඡා කරන්න. සියලුම කණ්ඩායම් සාමාජිකයින් එකග වන ප්‍රධාන අපේක්ෂණ ගන්න.<br><br>සෑම අමාත්‍යාංශයකටම වාර්තාකරුවෙකු පත්කර ගන්න.<br><br>සෑම කණ්ඩායමකටම වර්ණ 4කින් යුත් A4 කඩදාසි සපයන්නත සියලු දෙනාටම කියවිය හැකි වන පරිදි විශාල අකුරු ලියන්න.<br><br>b. අපේක්ෂණ පිළිබඳ අමාත්‍යාංශ කණ්ඩායම් සාකච්ඡා කරති - වාර්තාකාරු වෙන් වෙන් වශයෙන් A4 කඩදාසි වල අපේක්ෂණ ලියන්න.<br><br>සටහන - අමාත්‍යාංශ වාර්තාකරුවන්ගේ සටහන් සියල්ලන් සමගම සාකච්ඡා කරන්න.<br><br>c. මුළු කණ්ඩායමම ඉදිරියට ගෙන්වන්න.<br><br>• තම අමාත්‍යාංශ අපේක්ෂාවන් බිත්තියේ අලවන්න.<br>• එක් එක් පියවර අනුපිළිවෙලින් සකස් කරන්න.<br>• අමාත්‍යාංශ කිහිපයක් සහභාගී වන නිසා එකම කරුණ ඉදිරිපත් විය හැකියි.<br>• සියලුම අපේක්ෂණ ප්‍රදර්ශනය කරන තුරු නොකඩවා මෙම කාර්ය කරන්න. අපේක්ෂණ අවබෝධ කර ගැනීමට කණ්ඩායමට උපදෙස් දෙන්න. |

ක්‍රියාකාරකම් 2 -

අපේක්ෂණ

| | |
|---|---|
| A4 වර්ණ කඩදාසි - කණ්ඩායමක 4 බැගින් | • අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අපේක්ෂණ සාරාංශ ගත කරන්න. අපේක්ෂණ අනුපිළිවෙලින් හඳුනාගැනීමට සහභාගී වන්නන් යොමු කරවන්න.<br><br>මෙම ක්‍රියාකාරකම දිගු කාලීන නොවිය යුතු අතර කෙටි කාලීන ද විය නොහැක.<br><br>d. විශේෂිත වූ අපේක්ෂණ සහ විශේෂිත ක්‍රියාකාරකම් ඒ ඒ අමාත්‍යාංශ සමග සම්බන්ධ කරන්න. මෙය මුළු කණ්ඩායමක් වශයෙන් එකගව සිදු කරන්න.<br><br>විශේෂිතව ඉස්මතු නොවූ අපේක්ෂණ ඇත්නම් ඒවා පිළිබඳ සලකා බලන්න.<br><br>ඒ කෙසේදැයි විස්තර කරන්න.<br><br>1. ශිෂ්‍ය පාර්ලිමේන්තු මැතිවරණය හා වැඩ බෙදා දීමේ ලේඛනය<br>2. උප ක්‍රියාකරකම් සඳහා ලිපි ගොනු මාතෘකා<br>3. ශිෂ්‍ය පාර්ලිමේන්තු ඡන්ද කාඩ්පත<br>4. අපේක්ෂක හැඳුනුම්පත<br>5. ඡන්ද ගණන් කිරීමේ පත්‍රිකාව<br>6. අමාත්‍යංශ මට්ටමින් නිලධාරී ලේඛනය<br>7. සභා වාරයක පිළිවෙල සහිත තිර පිටපත (Script)<br>8. නාම යෝජනා පත්‍ර ලබා ගැනීමේ ලේඛනය<br>9. වැඩසටහන සංවිධානය සඳහා වූ පත්වීම් ලිපිය<br>10. ස්තුති ලිපිය<br>11. කැබිනට් මණ්ඩල කැඳවීම් ලිපිය<br>12. අමාත්‍යාංශ යෝජිත කාර්ය සැලස්ම |

